# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

**සැලකිය යුතුයි.**

- **ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

---

★ **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01) බදුල්ල, මාතලේ හා මොණරාගල වැනි දිස්ත්‍රික්කවල ව්‍යාප්ත වී වගා බිම් ..................... කලාපයට අයත් වේ. (වියළි/ අතරමැදි/ තෙත්)

02) පෘථිවි අභ්‍යන්තරයේ දී මැග්මා සිසිල් වී ඝනීභවනය වීමෙන් ........................... ආග්නේය පාෂාණ නිර්මාණය වේ. (ආක්‍රාන්ත/ නිෂ්ක්‍රාන්ත/ ග්‍රැනයිට්)

03) ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයක් ලෙස උතුරු ඇමෙරිකාවේ ................................ නිම්නය ප්‍රසිද්ධ ය. (මිසූරි/ ශාන්ත ලෝරන්ස්/ සැක්‍රමැන්ටෝ)

04) උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බැසීම .............................. ගෝලයේ විශේෂ ලක්ෂණයකි. (තාප/ පරිවර්තී/ අපරිවර්තී)

05) කහ මුහුද ............................... සාගර කලාපයට අයත් වේ. (පැසිපික්/ අත්ලාන්තික්/ ඉන්දියන්)

06) තස්මේනියා දූපත් .................................. මහද්වීපික තටකය තුළ පිහිටා ඇත. (ආසියා/ ඕස්ට්‍රේලියා/ අප්‍රිකා)

07) 2012 ශ්‍රී ලංකාවේ කාර්මික භාණ්ඩ අපනයන සංයුතිය අනුව වැඩිම වටිනාකමක් හිමිකරගෙන ඇත්තේ ..................................... නිෂ්පාදන ක්ෂේත්‍රයයි. (රබර්/ රෙදිපිළි හා ඇඟළුම්/ ආහාරපාන හා දුම්කොළ)

08) ලෝකයේ තිරිඟු වගා කරන රටවල් අතුරින් ........................... වැඩිම නිෂ්පාදනයක් සිදුකරන රට වේ. (චීනය/ ඉන්දියාව/ රුසියාව)

09) පෘථිවි ප්‍රාවරණය හරයෙන් වෙන්වෙන්නේ ............................... අසන්තතියෙනි. (ගුටෙන්බර්ග්/ මොහොරවිසික්/ ලේමන්)

10) 1:50,000 පරිමාණයට අනුව සකස් කළ ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ඡ රේඛා උස්බිම් දෙසට විහිදී තිබීමෙන් .................................... හඳුනාගත හැකිය. (කඳු මුදුන/ නෙරුව/ නිම්නය)

★ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

11) පැසිපික් සාගරය ලොව විශාලතම සාගරයයි. (නි / වැ)

12) ශ්‍රී ලංකාවේ තේ වගා කරන කලාප අතර මහනුවර දිස්ත්‍රික්කය උඩරට තේ වලට අයත් ය. (නි / වැ)

13) ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රම බලකායෙන් $\frac{1}{3}$ ක් පමණ කෘෂි අංශයේ රැකියාවල නිරත වී සිටිති. (නි / වැ)

14) ලෝක ජන සංඛ්‍යාවෙන් 90% ක් පමණ දකුණු අර්ධගෝලයේ ජීවත් වේ. (නි / වැ)

15) විල්පත්තුව, රිටිගල, ත්‍රිකෝණමඩු දැඩි රක්ෂිත ලෙස නම් කොට ඇත. (නි / වැ)

★ **අංක 16 සිට 22 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොද සම්පූර්ණ කරන්න.**

16) දකුණු ආසියානු රටවල් අතර අඩුම සාමාන්‍ය වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන වේගයක් පවතින රට ………………………….. යි.

17) ශ්‍රී ලංකා ගොඩබිම සිට නාවික සැතපුම් 12 දක්වා මුහුදු ප්‍රදේශය …………………………… නමින් හැඳින්වේ.

18) ග්‍රැනයිට් විපරීත වීමෙන් …………………………… පාෂාණ නිර්මාණය වේ.


19) ලොම් හා ලැටරයිට් පස හා මඳ බෑවුම් ප්‍රදේශ වඩාත් සුදුසු වන්නේ ……………………………… වගාව සඳහා ය.

20) උස් බිම් ප්‍රදේශයකින් ආරම්භ වී විවිධ දිශාවලට ගංගා ගැලීම නිසා සෑදෙන ජලවහන රටාව ………………………….. ජලවහන රටාව ලෙස හඳුන්වයි.

21) සුළු අපනයන බෝග පර්යේෂණ මධ්‍යස්ථානය ……………………………………….. පිහිටා ඇත.

22) කෙටි කාලයක් තුළ ජන සංඛ්‍යාවේ සිදුවන සීඝ්‍ර වර්ධනය ……………………………… ලෙස හැඳින්වේ.

★ **අංක 23 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කරගන්න.**




ජනසංඛ්‍යාවේ වාර්ෂික වර්ධන අනුපාතිකය

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012 අනුව සකස් කරන ලදී.

23) ඉහත ප්‍රස්තාර සටහන අනුව ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහන වර්ධනයක් දක්වන්නේ ……………………… වර්ෂයෙන් පසුවය.

24) ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යා වර්ධන අගය …………………………… ක් ලෙසට සටහන්ව ඇත.

25) මෙම ප්‍රස්තාරය ………………………………… ප්‍රස්තාර වර්ගයට අයත් වේ.

★ **අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26)

| අ<br>වන රක්ෂිත | ආ<br>ව්‍යාප්ත ප්‍රදේශ |
|---|---|
| 1. ජාතික වනෝද්‍යාන | A. රන්දෙනිගල |
| 2. දැඩි ස්වභාවික රක්ෂිත | B. රිටිගල |
| 3. අභය භූමි | C. ත්‍රිකෝණ මඩු |
| | D. ලුණුගම්වෙහෙර |

1) D A B 2) B C D 3) C A B 4) D B A

(……..)

27)

| අ<br>බෝගය | ආ<br>සුදුසු පස් වර්ගය |
|---|---|
| 1. තේ | A. ලවන මිශ්‍ර වැලි පස |
| 2. රබර් | B. ලොම් ලැටරයිට් පස |
| 3. පොල් | C. දියළු පස |
| | D. කබොක් මිශ්‍ර රතු පස |

1) B D C 2) A C D 3) B C D 4) A D C

(……..)

28)

| අ<br>අයත්වන මහද්වීපය | ආ<br>කඳු වැටිය |
|---|---|
| 1. උතුරු ඇමරිකා | A. අන්දීස් |
| 2. අප්‍රිකා | B. රොකී |
| 3. යුරෝපා | C. ඇල්ප්ස් |
| | D. ඇට්ලස් |

1) B D C 2) A C D 3) B C D 4) A D C

(……..)

29)

| අ<br>ඛනිජ වර්ගය | ආ<br>ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ |
|---|---|
| 1. ඉල්මනයිට් | A. දෙදියවල |
| 2. සිලිකා | B. බලංගොඩ |
| 3. සර්කෝන් | C. මාරවිල |
| | D. පුල්මුඩේ |

1) A B C 2) B C D 3) D C A 4) D C B

(……..)

30)

| අ<br>මෙට්‍රික් සිතියම්වල මායිම් | ආ<br>ඇතුළත් තොරතුරු |
|---|---|
| 1. ඉහළ වට තීරුව | A. භූ රූප |
| 2. සිතියමේ මුහුණත | B. සූචකය |
| 3. ඇතුළු මායිම් තීරුව | C. ජාත්‍යන්තර ඛණ්ඩාංක |
| | D. සිතියමේ නම |

1) D A B 2) D A C 3) B A D 4) A B C

(……..)

★ **අංක 31 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුර හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

31) ලෝකයේ උසම ස්ථානයක පිහිටි විල වනුයේ
1) ලැඩෝගා විල 2) අයර් විල
3) වික්ටෝරියා විල 4) ටිටිකාකා විල
(……..)

32) සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වටවූ මුහුදු පමණක් ඇතුළත් යුගලය තෝරන්න.
1) කැස්පියන් හා එරල් මුහුද 2) කළු මුහුද හා ජපන් මුහුද
3) මධ්‍යධරණී මුහුද හා රතු මුහුද 4) බෝල්ටික් මුහුද හා කැස්පියන් මුහුද
(……..)

33) ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රදේශයකට නිදසුනක් වන්නේ
1) මැඩගස්කරය 2) මියන්මාරය 3) ජපානය 4) තායිලන්තය
(……..)

34) එකලස් කිරීමේ කර්මාන්ත ගණයට අයත් නොවන කර්මාන්තය තෝරන්න.
1) මෝටර් රථ කර්මාන්තය 2) විද්‍යුත් කර්මාන්තය
3) කපු පිළි කර්මාන්තය 4) නැව් තැනීමේ කර්මාන්තය
(……..)

35) යකඩ හා වානේ මධ්‍යස්ථානවල නම් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?
1) ෂන්ෂුවාන්, පීකිං, කෝබේ 2) බීජිං, ඔසාකා, නාගසාකි
3) ෂන්ෂුවාන්, බීජිං, කුස්නෙට්ස්ක් 4) කුස්නෙට්ස්ක්, ඔසාකා, වොෂින්ටන්
(……..)

36) දූනට සොයාගෙන ඇති පැරණිම සිතියම ලෙස සැලකෙන මැටි පුවරුවක අඳින ලද සිතියම් නිර්මාණය කර ඇත්තේ කුමන ශිෂ්ටාචාරයක වැසියෙකු විසින් ද?
1) ග්‍රීක 2) රෝම
3) මෙසපොතේමියානු 4) චීන
(……..)

★ **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A | 1. වන විනාශය<br>2. ජෛව ගෝලය | C | 1. උන්නතාංශය<br>2. උෂ්ණත්වය |
| B | 1. පුම්තිරි අනුපාතය<br>2. කෘෂි අස්වැන්න | D | 1. මානුෂ සංවර්ධනය<br>2. සාක්ෂරතාව |

37) පළමුවැන්නේ පැවැත්ම සඳහා දෙවැන්න අත්‍යවශ්‍ය වේ යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක්ද?
1) A 2) B 3) C 4) D
(……..)

38) පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද?
1) A 2) B 3) C 4) D
(……..)

39) පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොමැති මාතෘකා යුගලය කුමක්ද?
1) A 2) B 3) C 4) D
(……..)

40) පළමුවැන්නේ අහිතකර ප්‍රතිඵලය දෙවැන්නට බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක්ද?
1) A 2) B 3) C 4) D
(……..)